FACULTY OF GRADUATE STUDIES
RECEIVED
0 1 MAR 2013
UNIVERSITY OF KELANIYA

# නිකාය භේදයේ ආරම්භය මහාවිහාරය අභයගිරි නිකායවල අරගලය

ශිෂ්‍ය අංකය - FGS/H/MSSC/2007/09



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 8 11 |
| වර්ග අංකය: | |



කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ සාමාජීය විද්‍යාපති
(ඉතිහාසය) පරීක්ෂණයෙහි එක් අවශ්‍යතාවක් පරිපූර්ණ කිරීම
සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධනයකි.

**2010 මැයි / ජූනි**

# සාරාංශය

ක්‍රි. පූ. 3 වන සියවසේ මහින්දාගමනයත් සමග ලංකාවේ ආරම්භ වූ භික්ෂු සමාජය මහාවිහාරය නැමති එකම ආයතනය යටතේ සමගි සංවිධානයක් වශයෙන් පැවතුණේ ශතවර්ෂ තුනකටත් වඩා අඩු කාලසීමාවක් තුළ බව පෙනේ. ක්‍රි. පූ. පළමුවන ශතවර්ෂයේ වළගම්බා රජු දවස ප්‍රථම වතාවට එකී සමගිය දෙදරා යන පරිදි කටයුතු සැලසුණි. ඉන්පසු බලයට පත් වූ පාලකයන් අතරින් වෝහාරික තිස්ස, ගෝඨාභය සහ මහසෙන් රජුන් දවස විවිධ නිකාය පහළවීමත්, එම නිකාය අතර මතභේද ඇතිවීමත් සිදු විය.

පහත සඳහන් පරිදි මෙම නිබන්ධනය පරිච්ඡේද හයකින් සමන්විත වේ. මෙහි පළමුවන පරිච්ඡේදයෙන් අවධානය යොමු වී ඇත්තේ මූලාශ්‍රය අධ්‍යයනය කිරීම සඳහා ය. යම් කාලයක ඉතිහාසය නිවැරදිව අවබෝධ කරගැනීම උදෙසා අත්‍යවශ්‍යම සාධකය ලෙස මූලාශ්‍රය හැඳින්විය හැකි ය. මෙම නිබන්ධනය ලිවීමේ+දී උපයෝගී කරගන්නා ලද මූලාශ්‍රය ප්‍රධාන වශයෙන් සාහිත්‍යය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ලෙස වෙන වෙනම සාකච්ඡා කර ඇත.

දෙවන පරිච්ඡේදයේ නිකාය භේදයේ ආරම්භය හා මහාවිහාර - අභයගිරි නිකායවල මතභේද පිළිබඳ තොරතුරු අනාවරණය කර ඇත. මුලින්ම නිකාය භේදය වළගම්බා රාජ්‍ය සමයේ ආරම්භ වූ බවත්, ඉන්පසු මහාවිහාරයෙන් වෙන් වූ භික්ෂූන් අභයගිරි විහාරය පිහිටුවා ගනිමින් වෙනම සංඝ ප්‍රජාවක් බිහි වූ ආකාරයත් විස්තර කර තිබේ. එමෙන්ම මීට සමකාලීනව ඉන්දියාවේ පැතිරීගිය මහායාන අදහස්වලට අභයගිරි විහාරික භික්ෂූන් අනුගත විය. ඒ අනුව මාහායින අදහස් දරන නව නිකායක් අභයගිරිය තුළ ගොඩනැගුණි. මීළඟට වෝහාරික රජ දවස ඇති වූ වෛතුල්‍යවාදයේ බලපෑම පිළිබඳව ද මෙම පරිච්ඡේදයේ සාකච්ඡාවට ලක්ව තිබේ. ඉන්පසු මහසෙන් රජ දවස මහාවිහාරය සහ අභයගිරි නිකායන් තුළ ඇති වූ විපර්යාසය පිළිබඳව ද කරුණු එකින් එක පෙළ ගස්වා ඇත.

තෙවන පරිච්ඡේදයෙන් ශාසන ශෝධන හා සංඝ සාමාග්‍රිය පිළිබඳ සාකච්ඡාවට බඳුන් කර ඇත. බුද්ධ ශාසනයේ භේද භින්න වී නැතහොත් දූෂිත වී පවත්නා බව පෙනී ගිය බොහෝ අවස්ථාවල රජවරු "ශාසන ශෝධන" කරවූහ. ඒ අනුව සීලාමේඝවණ්ණාභය, පස්වන කාශ්‍යප, පළමුවන උදය සහ හත්වන අග්බෝ යන රජුන් දවස සිදු කරන ලද ශාසන ශෝධන පිළිබඳව ද කරුණු සාකච්ඡා කර ඇත. මෙම පරිච්ඡේදයේ විශේෂයෙන් මහා පරාක්‍රමබාහු රජතුමාගේ ශාසන ශෝධනය හා සංඝ සාමාග්‍රිය පිළිබඳව තොරතුරු විස්තරාත්මකව සාකච්ඡාවට ලක් කර ඇත. එමෙන්ම දඹදෙණි යුගයේ පාලනය කළ හයවන පරාක්‍රමබාහු රජතුමාගේ ශාසන ශෝධනය ගැන ද තොරතුරු අනාවරණය වේ.

හතරවන පරිච්ඡේදයෙන් අවධානයට යොමු වන්නේ ලක්දිව මහායාන අදහස් අනිකුත් නිකාය කෙරෙහි ඇති කළ බලපෑම පිළිබඳවයි. විශේෂයෙන් ලක්දිව මහායානවාදීන්ගේ බලය වර්ධනය වී,

මහාවිහාරවාසීන්ට අභියෝගයක් වීමට බලපෑ සාධක පිළිබඳව ද මෙම පරිච්ඡේදයේ දී සාකච්ඡාවට ලක් වී ඇත. ඊට අමතරව ලක්දිව මහායාන අදහස් පිළිබඳ සාහිත්‍යමය වශයෙන් ලැබී ඇති තොරතුරු හා පුරාවිද්‍යාත්මකව හමු වී ඇති සාක්ෂි පිළිබඳ සාකච්ඡාවට බඳුන් වී ඇත.

පස්වන පරිච්ඡේදයෙන් කතිකාවත්වල ප්‍රභවය හා කතිකාවත් තුළින් හෙළිවන භික්ෂූන්ගේ ක්‍රියාකලාපය පිළිබඳ සාකච්ඡාවට බඳුන් වී ඇත. මෙහිදී පොළොන්නරුව කතිකාවත සහ දඹදෙණි කතිකාවත තුළින් හෙළිවන භික්ෂූන්ගේ දුශ්ප්‍රතිපත්ති පිළිබඳ තොරතුරු සඳහන් වේ. ඊට අමතරව හයවන පරාක්‍රමබාහු කතිකාවත, කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත සහ ශ්‍රී රාජාධි රාජසිංහ කතිකාවත පිළිබඳ තොරතුරු සඳහන් කර තිබේ.

හයවන පරිච්ඡේදයෙන්, වන සියවසෙන් පසුව ඇති වූ ශාසනික පරිහානිය සහ 18 වන සියවසෙන් පසු සියම් නිකාය පිහිටුවීම පිළිබඳ සාකච්ඡාවට ලක් කර තිබේ. 16 වන සියවසෙන් පසු ආරම්භ වන්නේ ලංකා ශාසන ඉතිහාසයේ අඳුරු යුගයකි. මෙම පරිහානියට ප්‍රධාන හේතු කිහිපයක් බලපානු ලැබිය. රාජාරක්ෂාව නැති වීම, ක්‍රිස්තියානි ආගමේ බලපෑම, දේශපාලන විප්ලවය, සමාජ විප්ලවය හා හින්දු ද්‍රවිඩ ආභාෂය, අර්ථ ක්‍රමය, කුල ක්‍රමය, ඥාති ශිෂ්‍ය ක්‍රමය හා රක්ඛංග උපසම්පදාව වැනි හේතු බලපානු ලැබුවේය. ඉන්පසු 18 වන සියවසේ මැද භාගය වන විට සරණංකර සංඝරාජ හිමියන්ගේ අප්‍රතිහත ධෛර්ය නිසා ලංකා බෞද්ධයන්ගේ සිත් ප්‍රබෝධමත් කරවන අන්දමේ ශාසනික දියුණුවක් ඇති විය. 18 වන සියවසේ සියම් දේශයෙන් භික්ෂූන් වැඩමවා ගෙන අවුත් ඇති කරන ලද උපසම්පදාව නිසා ලංකාවේ ශ්‍යාමෝපාලී වංසය හෙවත් සියම් නිකාය ආරම්භ වූ බවත් දැකිය හැකි ය. මේ උපසම්පදාව ලැබීමත් සමගම ගණින්නාන්සේලාගේ ක්‍රමය බෙලහීනව ගියේය. සියම් භික්ෂූන්වහන්සේලා විසින් පවත්වන ලද මෙම උපසම්පදාව එවකට ලක්දිව සිටි සියලුම භික්ෂූන්වහන්සේලා විසින් පොදුවේ පිළිගන්නා ලදී.